**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**

**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

මගේ අංකය / எனது இல. / My No. }

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2023-02-08

පැමිණිලි පාර්ශවය : ජී.එම්.එම්.ගලප්පත්ති මහතා,
අංක. 45ඒ, මේබල් කුරේ මාවත,
මහනුවර.

වගඋත්තර පාර්ශවය : විදුහල්පති,
මහ/ කිංස්වුඩ් විද්‍යාලය,
මහනුවර.

පැමිණිලි අංකය : HRC/KND/168/22/I

පැමිණිල්ල :-

පැමිණිලිකාර ජී.එම්.එම්.ගලප්පත්ති මහතා තම දරුවා වන දම්සර ප්‍රියතෙපුල් ගලප්පත්ති මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ 2022 වර්ෂයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කර එහි ප්‍රථම සම්මුඛ පරීක්ෂණය 2021.12.06 පවත්වා ලකුණු 90 ලබාදුන් නමුත්, ඉන් මාස 2කට පසු දුරකථන මාර්ගයෙන් එනම් 2022.02.23 දින පාසලට කැඳවා තමා විසින් සම්මුඛ පරීක්ෂණ සඳහා ඉදිරිපත් කරන ලද උප්පැන්න සහතිකය ව්‍යාජ බව දැනුම් දුන් බවත්, උප්පැන්න සහතිකයේ "ළමයාගේ උපත දැනුම් දෙන්නාගේ ලිපිනය" අංක 45/ඒ, මේබල් කුරේ මාවත, ප්‍රිම්රෝස් මහනුවර ලෙස ව්‍යාජ ලෙස සකස් කර ඇති බවට සැකයක් ඇති බැවින් එය නිවැරදි බවට තහවුරු කරගෙන එන ලෙස විදුහල්පතිවරයා තමාට දැනුම් දුන් බවත් එබැවින්, තමා අතිරේක රෙජිස්ට්‍රාර් හමුවී ඒ පිළිබඳ දැනුම් දුන් බවත්, අතිරේක රෙජිස්ට්‍රාර්තුමිය ඒ පිළිබඳ පරීක්ෂා කර බලා ඇයගේ දින රහිත ලිපියේ අංක 3267 දරණ උප්පැන්න සහතිකය ලේඛනාගාර තොරතුරු අනුව සත්‍ය පිටපතක් නමුත් 9 තීරය ව්‍යාජව සකස් කර ඇති බවට දැනුම් දීම හේතුවෙන් තමා ලබාගත් සියළුම ලකුණු 90 ශූන්‍ය කරන ලද බවත් දක්වා ඇත. ඒ අනුව තමා විසින් කරන ලද අභියාචනය මත, 2022.04.02 දින අභියාචනා පරීක්ෂණ සිදුකරන ලද අතර අභියාචනා මණ්ඩල සභාපති ලෙස මහනුවර ධර්මරාජ විද්‍යාලයේ විදුහල්පතිවරයා කටයුතු කරන ලද අතර ඔහු කිසිදු ලිපියක් නොබලා කිංස්වුඩ් විදුහල්පතිවරයාගේ තීරණයට විරුද්ධවීමට නොහැකි බව පවසමින් උප්පැන්න සහතිකය ව්‍යාජ ලෙස සලකා ලකුණු ලබානොදී ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් තම ළමයාට කිංස්වුඩ් විද්‍යාලයට



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson } 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail } sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone } 94 -11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary } 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline } 1996
වෙබ් / இணையம் / Web } www.hrcsl.lk

ඇතුළත්වීමේ අවස්ථාව අහිමිවූ අතර, තමා විසින් මහනුවර ධර්මරාජ විද්‍යාලයටද 2022 ළමුන් ඇතුළත් කිරීම සඳහා අයදුම්පතක් යොමු කරන ලද අතර, ඒ සඳහා එම ලේඛනම ඉදිරිපත් කරන ලද බවත්, ප්‍රථම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සභාපතිවරයා ලෙස ධර්මරාජ විද්‍යාලයේ විදුහල්පතිවරයා දරුවාගේ අංක 3267 දරණ උප්පැන්න සහතිකය සඳහා ලකුණු ලබාදුන් නමුත් කිංස්වුඩ් විද්‍යාලයෙන් ප්‍රතික්ෂේප කිරීම බලවත් ගැටළුවක් වන බවත් පැමිණිල්ලෙන් දක්වා ඇත.

දරුවාගේ අංක 3267 දරණ උප්පැන්න සහතිකය තමා කිසිසේත් වෙනස් නොකල අතර තමාගේ මහගෙදර ලිපිනය අංක 349/19, ශ්‍රීමත් කුඩාරත්වත්ත මාවත, දොඩම්වල, මහනුවර වන අතර එම ලිපිනයද පාසල ආසන්නයේ පිහිටා ඇති බැවින් එය වෙනස් කිරීමෙන් තමාට විශාල වාසියක් ඇති නොවන බවත්, තමා වර්තමානයේ පදිංචි අංක 45/ඒ, මේබල් කුරේ මාවත, ප්‍රිම්රෝස්, මහනුවර දරණ ලිපිනයේ 2015 වසරේ සිට පදිංචි නිසා පෙර පදිංචි ලිපිනය (අංක. 349/19, ශ්‍රීමත් කුඩාරත්වත්ත මාවත, දොඩම්වල) වෙනස් කිරීමට ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙත බාරදීමෙන් පසු රෙජිස්ට්‍රාර් කාර්යාලය මගින් එය වෙනස් කර ඇති බවත් දක්වා ඇත. තමා හට එසේ ලේඛනයක් වෙනස් කිරීමට කිසිම හැකියාවක් නොමැති අතර, එම උප්පැන්න සහතික දෙකම ලේඛනගාරයෙන් ලබාගත හැකි බවත්, නමුත් එම සහතිකය ව්‍යාජ හෝ කූට ලෙස සකස් කර ඇති බව විදුහල්පතිවරයා විසින් සඳහන් කිරීම නිසා තමා විසින් මේ පිළිබඳ ප්‍රාදේශීය ලේකම්වරයාට දැනුම් දීම නිසා, ඔහු විසින් නිකුත් කරන ලද අංක.KDS/KGK/6/7/2 හා 2022.03.07 ලිපියෙන් කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පති වෙත දැනුම් දී ඇත්තේ, අංක 45/ඒ, මේබල් කුරේ මාවත, ප්‍රිම්රෝස්, මහනුවර දරණ උප්පැන්න සහතිකය නීත්‍යානුකූල නොවන අයුරින් සකස් වී ඇති බැවින්, ඒ පිළිබඳ ඉදිරියේදී පරීක්ෂණ සිදුකරන බවත්ය. එම ලිපිය පිළිබඳ කිසිදු සැලකිල්ලක් නොදක්වා තම ළමයාට ලබාදුන් ලකුණු ශූන්‍ය කිරීම හේතුවෙන් කිංස්වුඩ් විදුහල්පතිවරයා හා අභියාචනා මණ්ඩලයේ සභාපති වන ධර්මරාජ විද්‍යාලයේ විදුහල්පති විසින් තම දරුවාට කිංස්වුඩ් විද්‍යාලයේ ඉගෙනීමට තිබූ අවස්ථාව අහිමි කර ඇති බවට පැමිණිල්ලෙන් වැඩිදුරටත් සඳහන් කර ඇත.

**වගඋත්තරකාර විදුහල්පතිවරයාගේ ලිඛිත කරුණු දැක්වීම :-**

මෙම ඉල්ලුම්කරු විසින් ඔහුගේ දරුවා වන දම්සර ප්‍රියතෙපුල් ගලප්පත්ති මහ/කිංස්වුඩ් විද්‍යාලයට ඇතුළත් කිරීම සඳහා CO-292 යටතේ ඉල්ලුම්කර ඇති අතර, එහි පදිංචි ලිපිනය අංක 45/ඒ, මේබල් කුරේ මාවත, ප්‍රිම්රෝස් මහනුවර ලෙස සඳහන්ව ඇති බවත්, මුල් සම්මුඛ පරීක්ෂණයෙන් පසු ලේඛනවල නිවරද්‍යතාව පරීක්ෂා කිරීම සඳහා අදාළ ආයතන මගින් විමසීම් කර ඇති අතර, ඉන් යම් ලේඛනයක් අසත්‍ය/කූට ලේඛනයක් නම් ඕනෑම අයදුම්කරුවකුට දුන් ලකුණු ශූන්‍ය කිරීම චක්‍ර ලේඛනයේ 9.2.8 අනුකූලව සිදුකරනු බවට සඳහන් කර ඇත. ඒ අනුව අයදුම්කරුගේ ළමයාගේ උප්පැන්න සහතිකයද එවැනි ලේඛනයක් බවට මහනුවර අතිරේක රෙජිස්ට්‍රාර් විසින් තහවුරු කිරීම නිසා ලකුණු ශූන්‍ය කිරීම සිදුකරනු ලැබූ බවද දක්වා ඇත.

වාචික කරුණු දැක්වීම :-

2022.07.21 දින පරික්ෂණයේදි වගඋත්තර පාර්ශවය වෙනුවෙන් පෙනී සිටි මහ/කිංස්වුඩ් විද්‍යාලයේ අංශ ප්‍රධානි ට්.එම්.ජේ.කේ.අමුණුගම මිය හා සම්මුඛ පරික්ෂණ ලේකම් එන්.එම්.පී.බෝවැල්ල මහත්මියගේ කරුණු දැක්වීම.

මෙම අයදුම්කරු ප්‍රථම සම්මුඛ පරික්ෂණයෙන් ලකුණු 90ක් ලබාගෙන ඇති නමුත් ළමයාගේ උප්පැන්න සහතිකය පසුව පරික්ෂා කිරිමේදි 9 වන තීරය ව්‍යාජ ලෙස සකස් කර ඇති බවට තහවුරු කිරිම නිසා ලකුණු ශුන්‍ය කර ඇති අතර, අභියාචනා පරික්ෂණ මණ්ඩලයද එම තීරණය ලබාදී ඇති බවට දක්වා ඇත. ළමුන් ඇතුළත් කිරීමේ චක්‍රලේඛනයේ 9.2.8 අනුව යම් ලේඛනයක් කූට බවට තහවුරු වුවහොත් ලකුණු ශුන්‍ය කළ හැකි බව සඳහන් වන බැවින්, පැමිණිලිකරුගේ දරුවා ඇතුළත් කිරිමට සුදුසුකම් නොලැබී ඇත.

නිරික්ෂණ - (නිරික්ෂණ සඳහා සලකා බලා ඇති ලේඛන)

01. පැමිණිලිකරුගේ ලකුණු සටහන
02. 29/2019 දරණ පාසැල් සඳහා ළමුන් ඇතුලත් කිරිමේ චක්‍ර ලේඛණය
03. දරුවාගේ 3267 දරණ පරිලෝකනය කරන ලද උප්පැන්න සහතිකය
04. දරුවා 3267 දරණ ගැටළු සහගත උප්පැන්න සහතිකය
05. ගඟවට ප්‍රාදේශීය ලේකම්ගේ පැහැදිලි කිරිම්, I, II,III,IV,V,VI
06. කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පති විසින් කොමිෂන් සභාව වෙත යොමුගත ලිඛිත සැලකිරිම් - I, II
07.අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කොමිෂන් සභාවට යොමු කරන ලද 2022.11.18 දිනැති ලිපිය
08. ගඟවට ප්‍රාදේශීය ලේකම් විසින් පරික්ෂණ සිදුකර කොමිෂන් සභාව වෙත එවන ලද 2022.12.08 දරණ ලිපිය

පැමිණිලිකාර ගලප්පත්ති මහතාගේ දරුවා වන දම්සර ප්‍රියතෙපුල් ගලප්පත්ති දරුවා මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ 2022 පළමු ශ්‍රේණියට ඇතුළත් කිරිම සඳහා නියමිත පරිදි අයදුම්පත් යොමු කිරිමෙන් අනතුරුව 2021.11.06 දින ප්‍රථම සම්මුඛ පරික්ෂණය සඳහා ඉදිරිපත් වී ලකුණු 90ක් ලබාගෙන ඇත.

එකී ලකුණු ලබාදීමෙන් පසු එනම්, 2022.02.23 වන දින පැමිණිලිකරු කැඳවා උප්පැන්න සහතිකය ව්‍යාජ බවට සැකයක් ඇති බැවින් එය ගඟවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් තහවුරු කරගන්නා ලෙස දැනුම් දි ඇත. ඒ අනුව ගඟවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අතිරේක රෙජිස්ට්‍රාර්වරියගේ 2022.02. දින රහිත ලිපියෙන් විදුහල්පතිවරයාට දැනුම් දී ඇත්තේ, දරුවාගේ 3267 දරණ උප්පැන්න සහතිකය ලේඛණාගාර තොරතුරු අනුව සත්‍ය නමුත් 09 තීරය ව්‍යාජව සකස් කර ඇති බවයි.

එම ලේඛනය පදනම් කරගෙන පැමිණිලිකරුගේ ලකුණු ශුන්‍ය කර ඇති අතර, ඊට පදනම් කරගෙන ඇත්තේ, 29/2019 ළමුන් ඇතුළත් කරගැනීමේ චක්‍රලේඛනය බවට වගඋත්තරකරු කරුණු දක්වා ඇත. පැමිණිලිකරු විසින් මේ පිළිබඳ තම නිවරද්‍යතාව ප්‍රකාශ කරමින් ගඟවට ප්‍රාදේශීය ලේකම් වෙත කරන ලද අභියාචනාවකට අනුව ගඟවට ප්‍රාදේශීය ලේකම් විසින් විදුහල්පතිවරයාට පිටපත් සහිතව ගලප්පත්ති මහතා වෙත යොමු කරන ලද 2022.03.07 දින ලිපියේ සඳහන් කර ඇත්තේ, 9 තීරයේ උපත දැනුම් දෙන්නාගේ නම 2017 මුල් මාස 03ට පසු නීත්‍යානුකූල නොවන අයුරින් සකස් කර ඇති බවත්, ඒ පිළිබඳ පරීක්ෂණ සිදුකිරිමට නියමිත බවත්ය.

එසේ ලකුණු ශුන්‍ය කිරිමට හේතුව හා ව්‍යාජ බව දැක්වීමට හේතුව ලෙස නිරීක්ෂණය වූයේ, පැමිණිලිකරුගේ දරුවාගේ උපන් දිනය 2016 මාර්තු 10 දින වන අතර එම උප්පැන්න සහතිකය අංක 3267 වන බවයි. එකී උප්පැන්න සහතිකයේ 9 තීරයේ උපත දැනුම් දෙන්නාගේ සම්පූර්ණ නම හේවා හීන්පැල්ලගේ අනෝමා ප්‍රියදර්ශනි අංක. 349/19, ශ්‍රීමත් කුඩරත්වත්තේ මාවත, මහනුවර (මව) ලෙස සඳහන්ව ඇති බවත් අනතුරුව මෙම උප්පැන්න සහතිකය 2017 මාස කිහිපයකින් පසු 9 තීරය අංක 45/ඒ, මේබල් කුරේ මාවත, ප්‍රිම්රෝස් මහනුවර ලෙස සංශෝධනය වී ඇති බවත් නිරීක්ෂණය වේ

නමුත් මෙම ගැටළුව අනුව තවදුරටත් නිරීක්ෂණය වනුයේ මෙම 3267 දරණ උප්පැන්න සහතිකය (ව්‍යාජ යැයි හඳුන්වන) පැමිණිලිකරු සතුව හා මහනුවර රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ නීත්‍යානුකූලව ලේඛනගතව ඇති බවයි. අංක 3267 දරණ උප්පැන්න සහතිකයේ 9 තීරයේ අංක 349/19 ශ්‍රීමත් කුඩාරත්වත්තේ මාවත, මහනුවර හා අංක 49/ඒ, මේබල් කුරේ මාවත, ප්‍රිම්රෝස් මහනුවර ලෙසද නීත්‍යානුකූල ලියාපදිංචි වී ඇති අතර, එම පිටපත් දෙකම පැමිණිලිකරු සතුව හා රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව සතුව ඇති බැවින් තවදුරටත් නිරීක්ෂණය වනුයේ එය පැමිණිලිකරු විසින් සාදා වෙනස් කරන ලද ලියකියවිල්ලක කොටසක් නොවන බවයි. මේ පිළිබඳ පැමිණිලිකරුගෙන් තවදුරටත් තහවුරු කරගැනීම සඳහා විමසීමේදී ඔහු විසින් සඳහන් කරනුයේ "අදාළ තීරය වෙනස් කිරිම සඳහා 2017 වසරේ තමා ඉල්ලීමක් කළ අතර, එය වෙනස් කිරිමේ ක්‍රමවේදය තමාට පැහැදිලි කර නොදුන් බැවින් තම ඉල්ලීම සඳහා අදාළ තීරයේ ලිපිනය වෙනස් කිරිම තම දෝෂයක් නොවන බවත්, එය කාර්යාලීය දෝෂයක් බවයි".

මහනුවර අතිරේක රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරන ලද ලේඛනයෙහි 3267 දරණ උප්පැන්න සහතිකයේ 9 තීරයේ අංක 45/ඒ, මේබල් කුරේ මාවත, මහනුවර ලෙස ව්‍යාජ ලෙස සකස් කර ඇති බවට සඳහන් වන අතර, ගඟවට ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරන ලද ලිපියේ අදාළ ලේඛනය නීත්‍යානුකූල නොවන අයුරින් සකස් වී ඇති බවට එකම ආයතනයක් (ගඟවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය) මගින් නිකුත් කර ඇති බැවින් මේ පිළිබඳ තවදුරටත් තහවුරු කරගැනිම සඳහා ගඟවට කෝරලේ ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් විමසීම් කර ඇත. ඔහුගේ 2022.09.02 දින පැහැදිලි කිරිමේදී සඳහන් කර ඇත්තේ, අදාළ උප්පැන්න සහතිකය 2016.03.20 දින ලියාපදිංචි වී ඇති බවත්, එහි දැනුම් දෙන්නාගේ ලිපිනය අංක 349/19 ශ්‍රීමත් කුඩාරත්වත්ත මාවත, මහනුවර ලෙස සඳහන් වු අතර, පරිලෝකනය කිරිමෙන් පසු අදාළ උප්පැන්න සහතිකයේ දැනුම් දෙන්නාගේ තීරය නීත්‍යානුකූල නොවන

අයුරින් වෙනස් කර ඇති අතර 9 තීරය වෙනස් කිරීම පැමිණිලිකරු විසින් සිදුකරන ලද්දක් බවට ද සාක්ෂි නොමැති බවයි.

එකී පැහැදිලි කිරීම සමඟ නිරීක්ෂණය වී ඇත්තේ, අදාළ උප්පැන්න සහතිකය පැමිණිලිකරු විසින් ව්‍යාජව සකස් කරන ලද ලේඛනයක් නොවන බැවින් කූට ලේඛනයක් ලෙස ප්‍රකාශ කළ නොහැකි බවයි. ඒ අනුව විදුහල්පතිවරයාට 2022.03.05 දින ලිපියෙන්, 'අදාළ උප්පැන්න සහතිකය 9 තීරය පැමිණිලිකරු විසින් වෙනස් කර නොමැති නිසා එය කූට ලේඛනයක් ලෙස සැලකිය නොහැකි බවත්, ඒ අනුව ළමුන් ඇතුළත් කිරීමේ චක්‍රලේඛනයේ 20/2019 අනුව ලකුණු ශුන්‍ය කිරීම තුළින් පැමිණිලිකරුට අගතියක් සිදුවී ඇති නිසා එය නිවැරදි කරන ලෙස' දැනුම් දී ඇත.

නමුත් විදුහල්පතිවරයා විසින් දැනුම් දෙනු ලැබුයේ, ළමුන් ඇතුළත් කිරීමේ චක්‍රලේඛනය ප්‍රකාරව නිවැරදිව ප්‍රථම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය හා අභියාචනා මණ්ඩල සභාපතිවරයා විසින් කටයුතු කර ඇති බැවින් මේ පිළිබඳ තමාට ඉදිරි කටයුතු කළ නොහැකි බවත්, ඒ සඳහා ඉදිරි කටයුතු කළ හැක්කේ අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්/ ජාතික පාසැල් අධ්‍යක්ෂ මඟින් පමණක් බවත්ය.

පැමිණිලිකරුගේ එම ප්‍රකාශය හා ලේඛණ පරීක්ෂාවේදී පෙනී යනුයේ, අදාල වෙනස් කිරීම සිදුකර ඇත්තේ පැමිණිලිකරු විසින් නොවන බවයි. ඒ බව ප්‍රාදේශීය ලේකම්වරයා විසින් කොමිෂන් සභාවට යොමුකර ඇති 2022.09.02 දිනැති ලිපියේ ද සඳහන් වේ.

පැමිණිලිකරු විසින් 2022 පළමු ශ්‍රේණිය සඳහා අයදුම්පත් යොමු කිරීමේදී, මහනුවර ධර්මරාජ විද්‍යාලයටද අයදුම්පතක් යොමු කර ඇති අතර, එම විද්‍යාලයේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන ලද අතර, එහි ප්‍රථම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සභාපති ලෙස ධර්මරාජ විද්‍යාලයේ විදුහල්පති කටයුතු කර ඇති අතර, ඔහු විසින් ඉහත 3267 උප්පැන්න සහතිකය සඳහා ලකුණු ලබාදී ඇති නමුත් ඔහු කිංස්වුඩ් විද්‍යාලයේ අභියාචනා මණ්ඩල සභාපති ලෙස කටයුතු කිරීමේදී එම ලේඛනය කූට ලේඛනයක් සේ ලෙස සලකා ලකුණු ශුන්‍ය කර ඇති බව තවදුරටත් නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

01. 3267 දරණ උප්පැන්න සහතිකය මහනුවර ගඟවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ උප්පැන්න මරණ ලියාපදිංචි රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලේඛණාගාර පිටපත ලෙස හා පරිලෝකන පිටපත ලෙස නීත්‍යානුකූලව ලියාපදිංචි කර ඇති බැවින් එහි 9 වන තීරයේ ලිපිනයේ වෙනස් වීම කෙසේ සිදුවීද යන්න පරීක්ෂා කර ඇති අතර එය පැමිණිලිකරු විසින් වෙනස් කර ඇද්ද යන්න තහවුරු කිරීම සඳහා කිසිදු සාක්ෂියක් නොමැත. ඒ අනුව 3267 දරණ උප්පැන්න සහතිකය පැමිණිලිකරු විසින් වෙනස් කර නොමැති බවට නිගමනය කළ හැක.

02. ගහවට ප්‍රාදේශීය ලේකම් විසින් කොමිෂන් සභාව වෙත යොමුකරන ලද 2022.09.02 දිනැති ලිපියෙහි, 03 ඡේදයේ සඳහන් වන පරිදි "9 තීරයේ ඇති ලිපිනය වෙනස් කිරීම සිදුකරන ලද්දේ පැමිණිලිකරු විසින්ම බවට පැහැදිලි සාක්ෂියක් නොමැත" යනුවෙන් සඳහන් කිරීම තුළින් පෙනී යනුයේ, කූට ලේඛනයක් ලෙස සැලකීමට කරුණු සාධක නොමැත.

03. විදුහල්පති විසින් පළමු සම්මුඛ පරීක්ෂණයේ උප්පැන්න සහතිකයේ 9 තීරයේ ලිපිනය වෙනස්වීම පිළිබඳ සලකා ලකුණු ශූන්‍ය කිරීමෙන් පසු අභියාචනා පරීක්ෂණ සඳහා පැමිණිලිකරු විසින් තම නිරවද්‍යතාව ගහවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් හරහාද සිදුකර ඇති මුත් අභියාචනා මණ්ඩලයද ඒ පිළිබඳ සැලකිල්ලක් දක්වා නොමැතිව ලකුණු ශූන්‍ය කිරීම අභියාචනා මණ්ඩලයේ කර්තව්‍ය නිසි ලෙස ඉටුකර නොමැති බවද නිගමනය කළ හැක.

04. එකී හෙළිදරව් වූ කරුණු හේතුවෙන් පැමිණිලිකරුගේ දරුවා හට සහනයක් ලබාදීම සඳහා කොමිෂන් සභාව විසින් විදුහල්පතිවරයාට දැනුම් දුන්නද, ඊට නිසි ක්‍රියාමාර්ග නොගැනීම නිසා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාට ද 2022.09.20 දින ලිපියෙන් දැනුම් දී ඇතත්, ඊට ප්‍රතිචාර නොමැති නිසා 2022.10.12 දින සිහිකැඳවීම් ලිපියක් යොමු කළ ද ඊටද ප්‍රතිචාර ලෙස අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික පාසැල් අධ්‍යක්ෂ විසින් යොමු කර ඇති 2022.11.18 දිනැති ලිපියේ සඳහන් වනුයේ ගැටළුවට අදාළව ගහවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් විසින් පරීක්ෂණ සිදුකරන බව දැනුම් දී ඇතිමුත් මෙතෙක් එම පරීක්ෂණ අවසන්ව ඇත්නම් එහි ප්‍රතිඵල මත හා කොමිෂන් සභාවේ විධිමත් නිර්දේශ මත ඉදිරි කටයුතු සිදුකළ හැකි බවයි.

05.ඒ අනුව කොමිෂන් සභාව විසින් 2022.11.27 දිනැති ලිපියෙන් ගහවටකෝරළේ ප්‍රාදේශීය ලේකම්වරයාට දැනුම් දී ඇත්තේ, මේ සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් සිදුකර කොමිෂන් සභාව දැනුවත් කරන ලෙසයි. එකී දැනුම්දීම අනුව ගැටළුවට අදාළ විධිමත් පරීක්ෂණ සිදුකර කොමිෂන් සභාව වෙත 2022.12.08 දිනැති වාර්තාව යොමුකර ඇත. ඒ අනුව "මීට අදාළව සියලු පාර්ශවයන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට කැඳවා 2022.12.02 වන දින සිදුකරන ලද පරීක්ෂණයේදී උප්පැන්නය හිමි දරුවාගේ පියාවන ජී.එම්.එම්. ගලප්පත්ති මහතාට එකී උප්පැන්නයේ 09 වන තීරයේ ලිපිනයේ වෙනස් කිරීම සඳහා භාරදුන් නිලධාරියා හඳුනාගැනීමට නොහැකි නිසා පරීක්ෂණ ඉදිරියට ගෙන යා නොහැකි ~~නිසා~~ බවත් පරීක්ෂණ අවසන් කරන බවත්, මින් ඉදිරියට උප්පැන්න සහතිකයේ අංක 349/19 ශ්‍රීමත් කුඩාරත්වත්ත මාවත, මහනුවර ලිපිනය සහිත උප්පැන්න සහතිකය නිකුත් කරන ලද බවත් හා අදාළ ලිපිනය වෙනස් කරන්නේ නම් ඉදිරියේදී නීත්‍යානුකූල ඉල්ලීමකින් වෙනස් කර ගත හැකි බවත්, මෙම දරුවා අදාළ විද්‍යායට ඇතුළත් කිරීම සම්බන්ධයෙන් කිසිදු විරෝධයක් නොමැති බවත්" දන්වා ඇත.

06. ඒ අනුව පැමිණිලිකරුට උප්පැන්න සහතිකයේ 09 වන තීරය නීත්‍යානුකූලව වෙනස් කිරීමට අවස්ථාව තිබියදී වංචා සහගතව වෙනස් කිරීමට චේතනාන්විත උත්සාහයක් ගෙන නොමැති බව ඉහත කරුණු අනුව තහවුරු වන බැවින් පැමිණිලි පාර්ශවයට හිමි සම්පූර්ණ ලකුණු ශූන්‍ය කිරීම යුක්ති සහගත නොවන බවට නිගමනය කළ හැක.

07. එසේම පාසැල්වල පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමේ චක්‍රලේඛ අංක 29/2019 (7.2) අනුව පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ළමුන් ඇතුළත් කරගැනීම සඳහා පදිංචිය තහවුරු කරනු ලබන ප්‍රධාන ලේඛන 7.2.1 හී පැහැදිලිව සඳහන් කර ඇත. එසේම එහි 7.2.1.2. මඟින් පදිංචිය තහවුරු කරන අතිරේක ලේඛන වශයෙන් හැඳුනුම්පත, රියදුරු බලපත්‍රය, දුරකථන බිල්පත්, රක්ෂණ සහතික, බැංකු පොත්, පාසල හැරයාමේ සහතිකය හා ළමයාගේ උප්පැන්න සහතිකය ඉදිරිපත් කළ යුතුව ඇත. ඒ අනුව ළමයාගේ උප්පැන්න සහතිකය අතිරේක ලේඛනයක් පමණක් වන අතර, මෙම පැමිණිල්ලට අදාළ වූ ගැටළුව උප්පැන්න සහතිකය මත පදනම්ව ඇති බැවින් එකී ලේඛනය සඳහා අහිමි වන ලකුණක් වේ නම් එය ඉවත් කළද පැමිණිලිකරු උපයාගෙන ඇති ලකුණු 90 න් අඩු වනුයේ එක් ලකුණක් පමණි. පාසලට ළමුන් ඇතුළත් කර ගැනීමේ කඩඉම් ලකුණු ප්‍රමාණය ලකුණ 83ක් වන බැවින් පැමිණිලිකරුට තම දරුවා පාසලට ඇතුළත් කර ගැනීමට ප්‍රමාණවත් ලකුණු හිමිව ඇති බවට වැඩිදුරටත් නිගමනය කරමි.

ඉහත කී සමස්ත කරුණු අනුව, පැමිණිලිකාර ජී.එම්.එම්.ගලප්පත්ති මහතාගේ දරුවා මහනුවර කිංස්වුඩ් විද්‍යාලයට ඇතුළත් කරනොගැනීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවේ සඳහන් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවේ සඳහන් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට අනාවරණය වී තිබීම මත පැමිණිලිකරුගේ දරුවා වන දම්සර ප්‍රියතෙපුල් ගලප්පත්ති සිසුවා මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ 2022 පළමු වසර සඳහා ඇතුළත් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙසට ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023.03-10 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ආචාර්ය විජිත නානායක්කාර,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. Vijitha Nanayakkara
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- 01. අමාත්‍යතුමා
අධ්‍යාපන අමාත්‍යංශය, ඉසුරුපාය, බත්තරමුල්ල.

02. අධ්‍යක්ෂ (ජාතික පාසැල්)
අධ්‍යාපන අමාත්‍යංශය, ඉසුරුපාය, බත්තරමුල්ල.

03. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යංශය, ඉසුරුපාය, බත්තරමුල්ල.

04. මා.හි.කො.ස ප්‍රාදේශීය කාර්යාලය,
මහනුවර.

B/